


# අනුන්ගේ කැදැල්ලේ බිත්තර දමන හැඩකාරියෝ

**පෙසන්ට් වර්ගයේ කුරුල්ලන් ලොව සිටින ආකර්ශනීය විශේෂයක් වේ. පෙසන්ට් කුරුලු විශේෂ 50 කින් 17 ක් පමණ ඉන්දියාවේදී හමුවෙන අතර ජෛව විවිධත්වයට පැහැදිලි සාක්ෂි සපයන මොවුන් සංරක්ෂණය කිරීම අද යුගයේ අවශ්‍යතාවක්ව ඇත.**


ආසියානු පෙසන්ට් කුරුලු විශේෂ ලෙස සැලකෙනTragoban පෙසන්ට් විශේෂ 5 කින් හතර වර්ගයක්ම ඉන්දියාවේ වෙසෙති. මෙම කුරුල්ලන් තරබාරුය. කෙටි හොට මහතය. පෙඳය මුවහත් නැත. ඉතාම පිළිවෙලකට මෙම පෙඳය පිළියෙල වී ඇත. පිරිමි සතුන්ගේ හිසේ මාංශමය අං පිහිටා ඇත. ගැහැනු, පිරිමි සම්බන්ධවීමේදී මෙම අං ඍජු ලෙස පිහිටයි.

ග්‍රීක බසින් මෙම කුරුල්ලන් හඳුන්වන්නේ අං සහිත පෙසන්ට් horn - pheasant ලෙසය. ග්‍රීක බසින් Trogon යනු පිරිමි එළුවාය. රෝම මිත්‍යාවන්ට අනුවPan ලෙස හඳුන්වන්නේ පිරිමියෙකුගේ අර්ධය සහ එවෙකුගේ අර්ධය ඇති පිළිඹිමුවයි. මෙම වචනාර්ථවල සහ සම්බන්ධවීම මගින් Trogopan වචනය ගැලපී ඇත. ඉතා අලංකාර පිරිමි කුරුල්ලන් Trojopan නමින් හඳුන්වන්නට යෙදුනේ මේ නිසාය. දීප්තිමත් රතු හෝ තැඹිලි වර්ණ ඇති පියාපත් මත සුදු තිත් වැටී ඇත.

Tragopan විශේෂ හතරක් ඉන්දියාවෙන් හමුවෙන අතර ඒ මෙසේ ය.

1. Western Tragopan – Tragopan melanocephalus
2. Satyr Tragopan – Tragopan Satyrd
3. Blyth's Tragopan – Tragopan blythi
4. Temminck Tragopan – Tragopan temmincki


මෙයින් පස්වන විශේෂය චීනයේදී පමණක් දැක ගන්නට ලැබෙන අතර ඔවුන් Cabot's Tragopan (Tragopan Caboti නමින් හඳුන්වයි. මුලින් සඳහන් කළ විශේෂ හතරම මුහුදු මට්ටමේ සිට මීටර් 2000 සෲ 4000 අතර වූ හිමාල කඳුකර කලාපයේ හැසිරෙති. Caboti Tragopan විශේෂය මීටර් 1400 - 1500 අතර සදහරිත කැලෑවන්හි සිය වාසස්ථාන ඉදි කර ගෙන සිටිති.



Western horn Tragopan නමින් ද හඳුන්වන Western Trajopan විශේෂය බටහිර හිමාලය ප්‍රදේශයට ව්‍යාප්තව ඇත. දැනට මොවුන්ගේ ව්‍යාප්තිය කාශ්මීරය, හිමාචල් ප්‍රදේශයේද අතරත්වල් ප්‍රදේශයේ කුමායන් කලාපය දක්වා විහිදී ඇත. ග්‍රීෂ්ම කාලයේදී මෙම කුරුල්ලන් මීටර් 3600 ක ඉහළ දුරක් දක්වා ගමන් කරන අතර ශිශිර කාලයේදී මීටර් 1400 - 1500 අතර පහත් බිම් දක්වා පැමිණෙති. ඔක්, කොනිෂර්වනාන්තර ප්‍රියකරන මෙම කුරුල්ලන් නිරන්තර පරීක්ෂාකාරී හැසිරීමෙන් යුක්තය.

ගැහැනු Tragopan කුරුල්ලන් සුදු දුඹුරු පැල්ලම් වලින් යුක්ත සිරුරෙන් යුක්ත අතර පිරිමි කුරුල්ලන්ට සාපේක්ෂව බලනවිට ඔවුන් ආකර්ශනීය නැත. පිරිමි කුරුල්ලාගේ ළැම ඉහළ ප්‍රදේශයේ යටි පැත්ත කළු පැහැතිය.

පපු ප්‍රදේශය රතු - තැඹිලි පැහැතිය. ඇස වටා රතු පැල්ලමකි. නිල් / සුදු පැල්ලම් සිරුර පුරා විහිදී ඇත. ගෙල වටා වූ රෙදිකඩක් බඳු (bib) රෝස සහ දම් පැහැති උගුරේ සම සංසර්ග කටයුතුවලදී පිම්බීමට පටන් ගනී.



අනෙකුත් Tragopan විශේෂයන්ට වඩා Western Tragopan විශේෂය තදවර්ණයෙන් යුක්තය. හිමාලය ප්‍රදේශයේදී මෙම කුරුල්ලා කුරුල්ලන් අතර රජෙක් යන අර්ථය ඇතුව Jujurana නමින් හඳුන්වනු ලබයි.

මෙම කුරුල්ලන්ගේ ගහනය නිශ්චිත ලෙසම ඇස්තමේන්තු වී නැතත් දළ වශයෙන් සඳහන් කරනවා නම් 5000 කටත් වඩා අඩුය. ඔවුන්ගේ ගති පුරුදුවලට එරෙහි වූ සාධක සහ වෙනත් හේතු මත මෙම පහළ බැසීම සිදුව ඇත. මේ නිසාම පරිWestern Trogapanසරවේදීන් විසින් විශේෂය සංරක්ෂිත කළ යුතු සත්ත්ව විශේෂයන්ගේ ලැයිස්තුවට ඇතුළත් කොට තිබේ.

මධ්‍යම හිමාලය ප්‍රදේශයේ හැසිරෙන Satyr Tragopan විශේෂය (Crimson horned pheasant හෝ Crimson Tragopan යන නමින් හඳුන්වනු ලැබේ. ඔවුන්ගේ ගහනය උත්‍රානවල් රාජ්‍යය, සිකැම් බටහිර බෙංගාලයේ උතුරු ප්‍රදේශය අරුනාචලම් ප්‍රදේශය ඇතුළත් නැගෙනහිර හිමාලය ප්‍රදේශය දක්වා ව්‍යාප්තව ඇත. අනෙකුත් Trapapan විශේෂයන්ට වඩා මොවුන්ගේසංඛ්‍යාව ඉහළ අතර ඒ පිළිබඳව තවමත් නිශ්චිත සංගනනයක් සිදු වී නොමැත.

Satyr Tragopan පිරිමි කුරුල්ලා ඉතාම ආකර්ශනීය වේ. ඔවුන්ගේ ගෙල සහ ගාත් ප්‍රදේශය තදරතු හෝ කුරුඳු පැහැය ගනී. ඉහළ ප්‍රදේශය දුඹුරු පැහැති අතර සුදු පැහැති තිත් වලිග ප්‍රදේශය දක්වාම ව්‍යාප්තව ඇත. නිල් පැහැති මාංශල අං සහ ගෙල වටා (bib) රෙදි කඩක් බඳු සම මොවුන්ට ද විශේෂ වේ. ගැහැනු කුරුල්ලා ප්‍රමාණයෙන් කුඩාය. සුදු පැල්ලම් ගාත්‍රා ප්‍රදේශයේ සහ නිල් පැහැති සමට වැටී ඇත.

Blyth Tragopan විශේෂයේ උප විශේෂ 2 කි.Tragopan blythi blythi විශේෂය ඉන්දියාවේ අරුනාචලම් ප්‍රදේශය / නාගලන්ත / මාන්පූර් / මිසොරන් ප්‍රදේශය චීනය සහ මියන්මාර් ප්‍රදේශයට ආවේණිකය. Tragopan blythi molesuorthi විශේෂය බ්‍රිතාන්‍යය සහ ඇතැම් විට අරුනාචලම් ප්‍රදේශයේ ඇතැම් කොටස්වලට ද විහිදී ඇත. මෙම විශේෂ දෙකම මුහුදු මට්ටමේ සිට මීටර් 1500 සිට 3000 අතර කලාපයට සීමා වී ඇත. ගස්කොළන් සහිත ප්‍රදේශවල හැසිරීම ප්‍රියකරන Tragopan විශේෂයන්ට අද සිය නිවාස පිළිබඳ ගැටළුව උග්‍ර අර්බුදයක් වී ඇත. වනාන්තර එළිවීම නිසා අද ජීවත්වීමට තිබුන අයිතිය අහිමිවීම නිසා ඔවුන් ද වඳවීමේ තර්ජනයට පත් විශේෂ ලෙස පරිසරවේදීන් විසින් ලැයිස්තුගත කොට ඇත.

Tragopan පිරිමි කුරුල්ලන්ගේ විශේෂත්වය නම් සුදු ලප, රතු නැඹිලි පිල් කලඹ, දීප්තිමත් කහ පැහැති සම, ලේන්සුවක ස්වරූපය ඇති උගුරේ සම (Throat Skin) ආදී වූ ශාරීරික ලක්ෂණයි. මොවුන්ගේ යටි ප්‍රදේශ අළු පැහැති නිසාම Greybellied Tragopan යන නමින්ද හඳුන්වනු ලැබේ. මෙම විශේෂයේ ගැහැනු සතුන් අළු පැහැති දුඹුරු වර්ණයෙන් යුක්ත අතර කහ සහ සුදු ලප සිරුර පුරා විහිදී ඇත.

> ඔවුන්ගේ ගහනය උත්‍රානවල් රාජ්‍යය, සිකැම් බටහිර බෙංගාලයේ උතුරු ප්‍රදේශය අරුනාචලම් ප්‍රදේශය ඇතුළත් නැගෙනහිර හිමාලය ප්‍රදේශය දක්වා ව්‍යාප්තව ඇත. අනෙකුත් Trapapan විශේෂයන්ට වඩා මොවුන්ගේසංඛ්‍යාව ඉහළ අතර ඒ පිළිබඳව තවමත් නිශ්චිත සංගනනයක් සිදු වී නොමැත.

නාගලන්ත රාජ්‍යය සිය ජාතික පක්ෂියා ලෙස Blyth Tragopan පක්ෂියා නම් කොට ඇත. මෙම කුරුල්ලන්ගේ ප්‍රාදේශීය විශේෂ කීපයක් ඇති අතර ඔවුන් සංරක්ෂණය කිරීමට ද නාගලන්ත රාජ්‍යයේ විශේෂ අවධානය යොමු වී ඇත.

ඉන්දියාවේ අරුනාචලම් ප්‍රදේශයේ දී හමු වෙනTemminck Tragopan විශේෂය Chinese Crimson Hormed Phesant ලෙස හඳුන්වනු ලැබේ. අනෙකුත් Tragopan විශේෂයන්ට වඩා බහුල ව්‍යාප්තියක් ඇති මොවුන් පිළිබඳ වැඩිමනක් විස්තර හඳුනාගෙන නැත. ශිශිරයේදී මීටර් 4200 ක උස් ප්‍රදේශවල හැසිරෙන මොවුන් ගිම්හ කාලයේදී මීටර් 2000 ක් වූ ප්‍රදේශවලට පැමිණෙති. Temminick කුරුල්ලන් Stayr Tragopan වර්ගයට බොහෝ සෙයින් සමානය. පිරිමි Temminck කුරුල්ලන්ගේ ශරීරයේ ඉහළ කොටස තද රතුපැහැතිය. සිරුර නිල් පැහැතිය. නැඹිලි පැහැති කර පටියකි. මලානික අළු පැහැති බින්දු හැඩැති ලප ලැම ප්‍රදේශය දක්වා පැතිරී ඇත. පිරිමි Temminck කුරුල්ලන්ගේ පිල් කලඹ සුදු පැහැතිය.

අරුනාචලම් ප්‍රදේශය Blyth's Satyr සහTemminck වර්ග තුනටම වාසස්ථාන සපයා ඇත. බූතානයේ සිට බටහිර කාමෙන්ග් දක්වා විහිදී ඇති ප්‍රදේශවල මුලින් සඳහන් කළ විශේෂ තුනට ආවේණික කලාප වේ.

Tragopan විශේෂිත කුරුල්ලන්ට පොදු වුන ලක්ෂණ අතර ඇති සාමාන්‍යතාවය නම් මෙම කුරුල්ලන් නිරන්තරවම ගස් ආශ්‍රිතව හැසිරීමයි. සිය කැදැලි ද ගස්වලම තනා ගන්නා මෙම කුරුල්ලන් විටෙක වෙනත් කුරුල්න්ගේ කුඩුවල ද බිජු දමති. Tragopan කුරුල්ලන් බොහෝ විට ආහාරයට ගන්නේ ඇට තණ කොළ, බෙරි වර්ග, පලතුරු කොළ සහ කුඩා කෘමීන්ය. පිරිමි කුරුල්ලා බොහෝවිට සිටිනුයේ කුඩා කන්දක් / ලී කොටයක් හෝ ගලකට මුවාවිය. ඔවුන්ගේ මෙම හැසිරීම තුළින් ගැහැනු කුරුල්ලාගේ ආකර්ශනය ඇති වේ. W.P.A ජාත්‍යන්තර ආයතනයේ උප සභාපති ආචාර්ය ජෝන් කෝඩර් සඳහන් කරන අන්දමට Tragapan කුරුල්ලන්ගේ ප්‍රජනන කාර්යය සාර්ථකවීමට ඔවුන්ගේ මෙම ගති ලක්ෂණය බොහෝ දුරට උපකාරී වී ඇත.

❑

**පුන්‍යා චාන්දනී ද සිල්වා**